# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 26 දරන සංගණන (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මැයි මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2011 මැයි මස 06 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 2.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2011 අංක 26 දරන සංගණන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 මැයි මස 06 වන දින]

එල්.ඩී.—ඕ. 4/2010.

**(143 වන අධිකාරිය) වූ සංගණන ආඥා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක 26 දරන සංගණන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. | ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) සංගණන ආඥාපනතේ 5 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "රුපියල් දස දහසක් නොඉක්මවන දඩ මුදලකට" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩ මුදලකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. | 143 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :— | ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"දිස්ත්‍රික් ලේකම්වරයා සංගණන කොමසාරිස්වරයා විය යුතු බව.

6. සෑම දිස්ත්‍රික් ලේකම්වරයකුම තමා පත්කර ඇති පරිපාලන දිස්ත්‍රික්කය සම්බන්ධව එම පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන, ඉටුකරනු ලබන සහ කරනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අමතරව එම දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් සංගණන කොමසාරිස්වරයා වශයෙන් පත්කරනු ලබන්නේය:

එසේ වුවද, සංගණන කොමසාරිස්වරයා වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරයා පත් කිරීම ප්‍රායෝගික නොවන බවට අමාත්‍යවරයාට පෙනී යන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් අවස්ථාවෝචිත පරිදි, එම පරිපාලන දිස්ත්‍රික්කය සඳහා හෝ එහි යම් කොටසක් සඳහා සංගණන කොමසාරිස්වරයා වශයෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— | ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—PL 005563—3,290 (2011/03)

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩ මුදලකට" යන වචන වෙනුවට "හෝ රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩ මුදලකට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩ මුදලකට" යන වචන වෙනුවට "හෝ රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩ මුදලකට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) එම වගන්තියේ (3) වන වගන්තියේ "හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩ මුදලකට" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩ මුදලකට" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.